දැරණියගල ප්‍රාදේශීය සභාව

කැගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 14 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, 2010 මාර්තු 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දැරණියගල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය .

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය සඳහා ලැබී තිබූ අක්කර බදු ආදායම රු. 1,477 ක් හා වර්පනම් බදු රු. 31,340 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.32,817 කින් වැඩියෙන්ද කලින් ලැබීම් මෙම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 30 දිනට අයවීමට තිබූ ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු රු.380,150 ක මුදල ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඇ) 2002 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රජයේ ආධාර රු.591,926 ක් හා මුදල් මාරු රු.505,000 ක මුදල් ශේෂ අවශ්‍ය කටයුතු සොයා බලා නිවැරදි නොකොට දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.39,283,507 ක් වූ අතර , උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.39,564,634 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු 2,742,732 ක් විය.

1.3.4 <u>අනුකූල නොවීම්</u>

විකල්ප එකතු කල අගය මත බදු (රඳවා ගැනීම) අංශයේ 2007 ජුනි 08 දිනැති අංක වීඩබ් /06/06/07 දරන ලිපිය අනුව 2007 ජනවාරි 01 දින සට ක්‍රියාත්මක වන පරිදි නියෝජිත ආයතන විසින් එම නියෝජිත ආයතන වලට කරනු ලබන සැපයීම් මත කොන්ත්‍රාත් කරුවන් හා සේවා සපයන්නන් හට ගෙවිය යුතු එකතු කල අගය මත බද්දෙන් 33 1/3%ක් රඳවා ගත යුතු වුවත් අවස්ථා දෙකකදී රු.2,550 ක් මෙපරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,495,926 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු 2,605,989 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 |
| (i) වරිපනම් හා බදු | 2,402 | 1,835 | 1,446 | 2,325 | 1,707 | 1,425 |
| (ii) බදු කුලී | 1,997 | 1,991 | 6 | 1,090 | 1,074 | 17 |
| (iii) බලපත්‍ර ගාස්තු | 785 | 785 | 11 | 787 | 778 | 26 |
| (iv) වෙනත් ආදායම් | 5,594 | 4,575 | 4,469 | 3,784 | 445 | 3,700 |

2.2.2. <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 05 ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ඇති සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ලබා ගැනීමට කටයුතු නොකර ඇස්තමේන්තු අගය වූ රු.2,268,505 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 <u>මුද්දර ගාස්තු</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු 1,937,360 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 <u>වරිපනම් හා අක්කර බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ158 හා166 වගන්තිවල විධිවිධාන අනුව යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් ඒ බද්ද අයවිය යුතු ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් එම බදු මුදල් අයකර ගත යුතු වුවද,2010 දෙසැම්බර් 31 දින වන විට රු.473,544 ක හිඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 <u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු | රු | රු | රු | රු | රු |
| | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 9,221 | 8,884 | 337 | 8,947 | 7,981 | 966 |
| අනෙකුත් | 5,494 | 4,751 | 743 | 3,744 | 4,777 | (1,033) |
| උප එකතුව | 14,715 | 13,635 | 1,080 | 12,691 | 12,758 | (67) |
| ප්‍රාග්ධන වියදම | 33,315 | 3,448 | 29,867 | 25,435 | 9,842 | 15,593 |
| මුළු එකතුව | 48,030 | 17,083 | 30,947 | 38,126 | 22,600 | 15,526 |

2.4 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 13 | 10 |
| ප්‍රාථමික | 16 | 16 |
| වෙනත් ( අනියම්,තාවකාලික) | 03 | 11 |

2.5 වත්කම් කළමණාකරණය

2.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී රු. 577,258 ක වත්කම් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව අනාවරණය විය.

2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.3,964,079 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශෙෂයන්හි එකතුව රු2,189,822 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.2,261,069 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 268,788 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රථවාහන නවතා තැබීම පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා 2010 ජනවාරි 21 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ අතුරු ව්‍යවස්ථාවක් පනවා රථවාහන නවතා තැබීමේ ගාස්තුඅයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) දෛනික වැටුප් පදනම මත බඳවාගෙන තිබූ රථවාහන පාලකවරයා විසින් 2010 වර්ෂය වෙනුවෙන් අයකර තිබූ ගාස්තු ප්‍රමාණය රු.99,440 ක් වූ අතර එම කාලය සඳහා

වැටුප් වශයෙන් ඔහුට රු.282,531 ක මුදලක් ගෙවීමෙන් සභාවට රු.183,091 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) රාජකාරි ඉටුකර නොතිබූ දින 129 ක් සඳහා රු.120,827 ක දීමනාද ගෙවා තිබුණි.

2. 7 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

(අ) <u>සම්පූර්ණයෙන් අතහැර දමා ඇති ව්‍යාපෘති</u>

ඇස්තමේන්තුගත පිරිවැය රු. 143,400 ක් වූ ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් අතහැර දමා තිබුණි.

(ආ) <u>ඉදිකිරීම්</u>

ඉදකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(i) මාර්ග කොන්ක්‍රීට් කර එය සවිවීම සඳහා දින 14 ක කාලයක් ඉකුත්වීමට පෙර කාර්මික නිලධාරි විසින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.

(ii) පහත සඳහන් කර්මාන්ත වලට අදාල ලිපිගොනු පරීක්ෂා කිරීමේදී ගිවිසුම් අත්සන් කරන ලද දිනයට හෝ ඊට පෙර කර්මාන්තය ඉටුකර තිබූ බව අනාවරණය විය.

| <u>කර්මාන්තයේ නම</u> | | <u>නිරීක්ෂණ</u> |
|---|---|---|
| (i) | දෙමැද තන්ත්‍රික කන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම | ගිවිසුම අත්සන් කිරීම හා හැකියා සහතිකය නිකුත් කිරීම 2010 මාර්තු 24 දින සිදු කර තිබූ අතර එදින වැඩ නිමකල බවට අදාල සමෘද්ධි බලකාය විසින් දන්වා තිබුණි. |
| (ii) | මංචනායක මාවත හරහා නාවෙල මාර්ගය සංවර්ධනය කිරීම | ගිවිසුම් අත්සන් කල දින වූ 2010 ඔක්තෝබර්18 වැනි දින වැඩ අවසන් කර ඇති බව අදාල සමිතිය විසින් දනවා තිබීම හා කාර්මික නිලධාරි ගේ වැඩ අවසන් කල දිනය හා පරීක්ෂා කල දිනය ලෙස 2010 ඔක්තෝබර් 29 ලෙස දක්වා තිබුණ අතර ප්‍රතිපූරණය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කර තිබුණේ 2010 ඔක්තෝබර් 28 දින දීය. |

| | | |
|---|---|---|
| (iii) | මාවතැන්න මාර්ගය<br>සාටාකන්ද කොටස<br>කොන්ක්‍රීට් කිරීම | 2010 ඔක්තෝබර් 15 දින ගිවිසුම් අත්සන් කර තිබුණද එදින ව්‍යාපෘතිය නිමකල බව අදාල බලකාය විසින් දන්වා තිබුණි.ග්‍රාම නිලධාරී හා සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් වැඩ ආරම්භ කල දිනය ලෙස 2010 මාර්තු 12 ලෙස හා අවසන් කල දින ලෙස 2010 මාර්තු 13 දිනය දක්වා තිබුණි. |

(ඈ) නක්කාවිට පාසැල අසල සිට පන්සල පාර කොන්ක්‍රීට් කිරීම හා පේරුපල්ල කඩවත මාර්ගය කොන්ක්‍රීට් කිරීම යන කර්මාන්ත වල ප්‍රමාණ පත්‍රය හා වියදම් ඇස්තමේනතුව නිසි බලධාරියෙකුගේ අනුමැතියකින් තොරව වෙනස්කර කර්මාන්ත ඉටුකර තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) තොග පාලනය